**නිමවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු ව්‍යාපෘතිය - 2018**

**-----------------------------------------------------------------------------------**

නිමවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2011 දෙසැම්බර් 27 දින එළඹී අංක (ටීඑෆ්) 099870 දරන ප්‍රධාන ගිවිසුමේ II(බී) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධිවිධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණ, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

නිමවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු ව්‍යාපෘතියේ ප්‍රධාන ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ පවත්නා නිවාස මලාපවහන සම්බන්ධතා සංඛ්‍යාව හා නව මලාපවහන ජාලයන් වැඩිකිරීම හා ගෘහස්ථ මට්ටමින් ස්ථානීය සනීපාරක්ෂක සේවා වැඩි දියුණු කිරීම මඟින් මහ කොළඹ ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී නිවැසියන් සඳහා සනීපාරක්ෂක සේවා වැඩි දියුණු කිරීමයි. ප්‍රධාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,559 කට සමාන එ.ජ.ඩො. මිලියන 13.10 ක් වන අතර ඉන් රු.මිලියන 583.66 කට සමාන එ.ජ.ඩො.මිලියන 5.08 ක් මූල්‍යයනය කිරීම සඳහා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2019 මාර්තු 31 දක්වා 3 න් වතාවක් දීර්ඝ කර ඇත.

### 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- 

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව | බලපෑම | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දින දක්වා ගෙවන ලද රු.මිලියන 172.74 ක් වූ එකතුකල අගය මත බදු ප්‍රමාණය ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකයට එරෙහිව හිලව් කර තිබුණි. | රජයේ දායකත්වය අඩුවෙන් දැක්වීම. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පිළිගත් ප්‍රතිපත්තියට අනුව, රජයෙන් ලැබුණු දායකත්වයට එරෙහිව එකතුකල අගය මත බදු හිලව් කර ඇත. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ සමස්ථ දායකත්වය පිළිඹිබු වන පරිදි අදාල පිරිවැය සැලකිල්ලට ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුලදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගෙවන ලද රු.මිලියන 6.48 ක ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ කාර්ය මණ්ඩල වේතනය ගිණුම්වලට ගෙන නොතිබුණි. | කෙරීගෙන යන වැඩ වටිනාකම අඩුවෙන් දැක්වීම. | නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන වාර්තා සමඟ වරින් වර සංසන්දනය කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුලදී සරල කරන ලද සහ සාම්ප්‍රදායික මලාපවහන දීර්ඝ කිරීම සංරචකය යටතේ වූ රු.මිලියන 7.11 ක කලවැඩ වටිනාකම සහ ඒ සඳහා වූ එකතු කල අගය මත බදු වටිනාකම වූ රු.මිලියන 1.06 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි. | -එම- | නිසිලෙස අදහස් දක්වා නොමැත. | සමාලෝචිත වර්ෂය අවසානයේ සහතික කලවැඩ වටිනාකම ගිණුම්වලට ගත යුතුය. |

### 2.2 නීති, රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

| නීති, රීති රෙගුලාසින්ට යොමුව | බලපෑම | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2010 ජුලි 26 දින කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 05 ට අනුව, ව්‍යාපෘතියේ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනයට භාජනය කර නොතිබුණි. | ප්‍රධාන අවශ්‍යතාවයන් ට අනුකූල නොවේ. | නිසිලෙස අදහස් දක්වා නොමැත. | අවශ්‍යතාවය අනුව අනුගත විය යුතුය. |

## 3 භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

2018 දෙසැම්බර් 31 දින වන විට සෘජු මලාපවහන සම්බන්ධතා, සම්ප්‍රදායික මලාපවහන දීර්ඝ කිරීම හා සරල කරන ලද මලාපවහන සම්බන්ධතා සහ නව විමධ්‍යගත ජාලයන් යන සංරචක යටතේ වූ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇත. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ප්‍රමාද වීම සහ කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් ස්ථානීය සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම් සංරචකය යටතේ වූ ක්‍රියාකාරකම්හි 2018 දෙසැම්බර් 31 දින වන විට මන්දගාමී ප්‍රගතියක් පෙන්වා ඇත. පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| සංරචකය | ක්‍රියාකාරකම | 2018/12/31 දින ප්‍රගතිය | | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරදේශ |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්කය | තථ්‍ය | | | |
| ස්ථානීය සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීම් | දෙහිවල, මොරටුව, කොලොන්නාව සහ ජා-ඇල ප්‍රදේශවල ජල පිරිපහදු පද්ධති ඒකක ස්ථාපනය කිරීම. | 3,785 ඒකක | 3,400 ඒකක | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නියමිත වේලාවට නිම කිරීම ප්‍රමාද වීම | ප්‍රධාන කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරීත්වය සහ ව්‍යාපෘතියේ විසුරුණු ස්වාභාවය, ප්‍රමාණවත් ශ්‍රම බලකායක් යෙදවීමට ඇති දුෂ්කරතා සහ නියමු ව්‍යාපෘතියක් ලෙස නව සංකල්පයක් ක්‍රියාත්මක කිරීමේදී මුහුණු දෙන ගැටළු වැනි ව්‍යාපෘති නිශ්චිත හේතු කිහිපයක් මෙම ප්‍රමාදයන් සිදුවීමට හේතු වී ඇත. එබැවින් ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා නව කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට පියවර ගන්නා ලදී. | ව්‍යාපෘතියේ දීර්ඝ කරන ලද කාල සීමාව තුළ ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ ක්‍රියාකාරකම් සමීප අධීක්ෂණයක් කිරීම අවශ්‍ය වේ. |